පස්යොදුන් රටේ ඓතිහාසික පසුබිම

අජිත් තල්වත්ත

මායා රටට අයත් ශ්‍රී ලංකාද්වීපයේ කඩඉම්පොතේ සඳහන් වන පස්යොත්ත නම් වූ රාජ්‍යය මෙරට ඉතිහාසයේ මානව ක්‍රියාකාරකම් ගණනාවකට සම්බන්ධ වේ. නූතන සමාජ කථිකාව තුළ ද පස්යොදුන් රට පිළිබඳ විශේෂ අවධානයට සහ කථාබහට ලක් වී ඇත. පස්යොදුන් රට ලෙස ව්‍යවහාරයට පත්ව ඇත්තේ යොදුන් පහකින් සමන්විතව පැවැති නිසාය. "කඩඉම් පොතෙහි" පස්යොදුන් රට දිගින් හා පළලින් යොදුන් පහක් සහ වටින් විසි යොදුනක් වූ බව සඳහන් වේ. මහාවංසයෙහි "පංචයෝජනරට්ඨ" වශයෙන් සඳහන් වන මෙහි දේශසීමාවන් ලෙස උතුරින් කළු ගඟත්, නැගෙනහිරින් රක්ඛ පාෂාණ ප්‍රදේශයත්, දකුණින් හිමතිත්ථ ග්‍රාමයෙන් මහ මුහුදට ගලා වැටෙන බෙන්තර ගඟත්, බටහිරින් මහ මුහුදත් සැලිකිණි. මෙම ප්‍රදේශය ගැන තොරතුරු වැඩි වශයෙන් සඳහන් වන්නේ මහ පැරකුම් රජුගේ (ක්‍රි:ව: 1153 - 1186) කාලයේ සිටය. පස්යොදුන් රට පිළිබඳ ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කිරීමේ දී මහාවංසයත්, ගලපාත ලිපියත් බෙහෙවින් උපකාරී වේ. පස්යොදුන් රටට අයත් ඇතැම් ප්‍රදේශ ප්‍රාග් ඓතිහාසික යුගය දක්වා වූ ඉතිහාසයකට උරුමකම් කියනු ලැබේ. විශේෂයෙන්ම පස්යොදුන් රටට නැගෙනහිර මායිමේ පිහිටි බුලත්සිංහලට නුදුරු පාහියන්ගල ලෙනෙන් හමුවන මානව අවශේෂ මෙහි ඓතිහාසිකත්වය මනාව පිළිබිඹු කරයි. වසර දාසය දහසකට පෙර මෙහි මානවයන් වාසය කළ බවට මහාචාර්ය ශිරාන් දැරණියගල මහතා විසින් සිදුකරන ලද පුරාවිද්‍යා පර්යේෂණ මඟින් තහවුරු කර තිබේ. ලිඛිත මූලාශ්‍ර තොරතුරු හමු නොවන ස්ථානයක් වුවත් පුරා විද්‍යාත්මක දත්ත මඟින් හෙළිවන ඓතිහාසිකත්වය ඉතා වැදගත් වේ.

පස්යොදුන් රට අතීත විරුවන්ට ආරක්ෂාව සැපැයූ ක්ෂේම භූමියකි. අනුරාධපුර රාජධානිය ක්‍රි:ව: 1017 දී බිඳ වැටීමෙන් අනතුරුව චෝළ බලය රජරට ස්ථාපිත විය. පොළොන්නරුව අභිනව රාජධානිය කරගත් චෝළයෝ ක්‍රි:ව: 1070 දක්වා ස්වකීය බලය ව්‍යාප්ත කළහ. මෙම පාලනය නිසා රජරට ජනතාවට හිරිහැර විඳීමට සිදුවිය. මෙම කාලය අතරතුර චෝළ විරෝධී සටන රුහුණු ප්‍රදේශයෙන් පණ ගැන්විය. රුහුණ කේන්ද්‍ර කර ගනිමින් චෝළ විරෝධී සටන දේශහිතෛෂීන් විසින් දියත් කළ අතර, එහි දී කිත්ති කුමරා සුවිශේෂ කාර්යභාරයක් ඉටු කළේය. එම උදාර ක්‍රියාවලියේ දී ඔහුට නොයෙකුත් අභියෝගයන් එල්ල වූ බව පෙනේ. තම ආරක්ෂාව සඳහා දිවයිනේ විවිධ ප්‍රදේශයන්ට පසු බැස්ස බව වංසකථා සාක්ෂි දරයි. පළමුවැනි විජයබාහුට (ක්‍රි:ව: 1070 - 1110) ආරක්ෂාව සලසාගෙන බලය ලබාගැනීමට උපකාරී වූ ස්ථානයක් ලෙස පස්යොදුන් රට සැලැකීමට හැකිය. චෝළ විරෝධී සටන දියත් කිරීමේ දී පස්යොදුන් රටින් සේනා රැගෙන ගිය බව මහාවංසය කියයි. පළමුවැනි

විජයබාහු සමයේ දී රුහුණු ප්‍රදේශයට අයත් පස්යොදුන් රට පාලනය කිරීමට තම සොහොයුරු වීරබාහු යොදවන ලදී. පළමුවෙනි විජයබාහුගේ සොයුරිය වූ මිත්තා කුමරියට දාව උපන් මනාභරණ, කීර්ති ශ්‍රී මේඝ සහ සිරි වල්ලභ යන තුන්බෑයින් විසින් පොළොන්නරුවට පහර දීමට යාමේ දී බෝධිසේන පබ්බත නම් ස්ථානයෙහි කළ සටනින් ආරක්ෂාව සඳහා පැමිණි බව වංශකථාව දක්වයි. ඉන් අවබෝධ වන්නේ මෙම ප්‍රදේශය ආරක්ෂාවට වඩාත් යෝග්‍ය වූ බවකි.

පස්යොදුන් රටෙහි ස්වර්ණමය යුගය උදාවන්නේ පොළොන්නරුවේ බලයට පත් මහා පරාක්‍රමබාහු (ක්‍රි:ව: 1153 - 1186) රාජ්‍ය සමයේ දී ය. පුරාවිද්‍යා මූලාශ්‍රයන් ලෙස ශිලා ලිපිවල "පස්යොදුන්" යන වචනය භාවිතයට එන්නේ මෙතැන් සිටය. දක්ෂිණ දේශයේ පාලකයා වශයෙන් බලයට පත්ව මෙරට ඉතිහාසයේ පෙර නොවූ විරූ අයුරින් කෘෂිකාර්මික සංවර්ධනය ඇතිකර "පෙරදිග ධාන්‍යාගාරය" යන විරුදාවලියෙන් මෙරට හැඳින්වීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළේ මෙතුමාය. දක්ෂිණ දේශයෙන් ආරම්භ කළ කෘෂිකාර්මික සංවර්ධනය පස්යොදුන් රට ඇතුළු විශාල ප්‍රදේශයක් පුරා පැතිර ගියේය. වංශකථාවේ සඳහන් පරිදි එදා මෙම ප්‍රදේශය වගුරු බිමකි. වගා කිරීමට තරම් සුදුසු තත්ත්වයක නොපැවතුණේය. මෙහි මහා වගුරු බිමේ හා ජලජ භූමි බිඳවා ඒවායේ ජලය ගංගාවලට බස්සවා, තෙත් බිම් බවට පරිවර්තනය කළේය. දැනට හඳුනාගෙන ඇති තොරතුරුවලට අනුව මෙම ප්‍රදේශයේ අක්කර 19,783 ක් පමණ අස්වැද්දවීමට හැකි වී ඇත.

මහා පරාක්‍රමබාහු රජතුමා විසින් සංකේන්ද්‍රගත පාලනයක් අනුගමනය කළ ද ඇතැම් ප්‍රදේශවල පාලන පහසුව සඳහා නිලධාරීන් ද පත්කර සිටියේය. පස්යොදුන් රටට ද සෙනෙවියන් පත්කර සිටි අතර ඔවුන් ලෙස කේසධාතු ලෝක සහ කේසධාතු දේවරාජ විය හැකි බවට විද්වතුන් අනුමාන කරයි. මහ පැරකුම් රජු දිවයිනේ අගරජු වශයෙන් අභිෂේක කළත් රාජ්‍යත්වය තහවුරුවීම නීත්‍යානුකූල නොවීය. එයට හේතුව වූයේ පෙර සිට පැවැත ආ රාජ්‍යත්වය තහවුරු කිරීමේ පූජනීය වස්තූන් වූ දළදාවහන්සේ සහ පාත්‍රා ධාතුව සුගලා බිසව භාරයේ පැවතීමයි. ඒවා ලබා ගැනීම පිණිස රජුට දැඩි අරගලයක නිරත වීමට සිදු වූයේය. සේනාංක කිහිපයක් ඇය පරාජය කිරීම සඳහා රුහුණට යවා තිබේ. එම අවස්ථාවේ රුහුණට ප්‍රහාර එල්ල කිරීම සඳහා සටන් මෙහෙය වූ ප්‍රවේශ මාර්ගයක් ලෙසද පස්දුන් රට හැඳින්විය හැකිය.

පස්යොදුන් රට ඓතිහාසිකත්වය මැනැවින් විදහා පෙන්වන සාක්ෂියක් වශයෙන් ගලපාත විහාර ලිපියයි. මෙම ශිලා ලිපිය පළමුවන පරාක්‍රමබාහු යුගයට හෝ දෙවන පරාක්‍රමබාහු යුගයට හෝ අයත් වන්නේදැයි මතභේදයට ලක්ව ඇත. එනමුත් බොහෝ විද්වතුන් විසින් පිළිගත් මතයක් වන්නේ මෙම ලිපි මහා පැරකුම් රාජ්‍ය සමයට අයත් බවයි. ඉහතින් පෙන්වා දුන් ලෙස අභිලේඛනයක පස්දුන් රට පිළිබඳව සඳහන් වන එකම අවස්ථාව මෙය පමණි. එම ලිපියට අනුව පස්යොදුන් රට පාලකයා ලෙස අවබෝධ වන්නේ කහම්බල්කුළු මින්දල් නා නමැත්තාය. මොහු සැබැවින්ම ඉඩම් හිමියකු බව පෙනේ. විහාර කර්මාන්තයේ අභිවෘද්ධියට ඔහු සහ ඔහුගේ ඥාතීන් විසින් කරන ලද පරිත්‍යාගයන් සහ සේවාවන් පිළිබඳ විස්තරයක් ගලපාත විහාර ලිපියෙහි සඳහන්ව ඇත. මෙම විහාරය කාලිංග වංශ නිශ්ශංකමල්ල (ක්‍රි:ව: 1186 - 1196) රාජ්‍ය සමයට සහ සම්බන්ධව පවතී. එතුමා විසින් කරන ලද සේවාවන් පස්දුන් රට ශාසනික ඉතිහාසයෙහි සඳහන් වේ. බෙන්තර ගං ඉවුරේ වනවාස මහා විහාරයට අසලින් පිහිටි ගල් පර්වතයක් අද "නිශ්ශංකගල" යනුවෙන් භාවිත වේ. මෙය මේ රජු සිහිවීමට තබන ලද එකකි.

දඹදෙණියේ බලයට පත් දෙවන පරාක්‍රමබාහු (ක්‍රි:ව: 1236 - 1270) සමයේ දී නැවත වරක් පස්යොදුන් රට පිළිබඳව වැදගත් ඓතිහාසික සාධක මහාවංසයෙහි සඳහන් වේ. මෙම රජුගේ ඇමැතිවරයකු වූ දේවප්‍රතිරාජ මහ ඇමතිවරයාගේ සහය ඇතිව පස්යොදුන් රටෙහි යටිතල පහසුකම් වර්ධනයට ක්‍රියාකර ඇත. බෙන්තොට ආසන්නයේ පිහිටි කලුවාමෝදර පාලම, කළු ගඟ අසල කෙසෙල්හේනාවේ පාලම, කදලිසේන ග්‍රාමයෙහි පාලම යනාදිය ඉදිකර ඇත. එපමණක් නොව කළුතර සිට බෙන්තර දක්වා මුහුදු තීරයේ රට ඇතුළට සැතැපුම් නමයක් පමණ පළලට පොල් උයනක් කරවූ බව මහාවංසයෙහි සඳහන්ව ඇත. ඒ තුළින් එම ප්‍රදේශයේ සශ්‍රීකත්වයක් ඇතිවන්නට ඇතැයි විශ්වාස කළ හැකිය. ගම්පොළ යුගයේ රචිත තිසර සන්දේශය අනුව පස්යොදුන් රටට අයත් බෙන්තොට ප්‍රදේශය දියුණුව තිබුණු බව කියයි.

පස්යොදුන් රටට විශේෂ තැනක් හිමිවන්නේ පෘතුගීසි සමයේ දී ය. (ක්‍රි:ව: 1505 - 1658) ක්‍රි:ව: 1521 දී සිදුවන විජයබා කොල්ලය නිසා කෝට්ටේ රාජධානිය නැවත කොටස් තුනකට බෙදුණේය. මෙම බෙදීමෙන් අනතුරුව හත්වන බුවනෙකබාහු කෝට්ටේ ද, මායාදුන්නේ සීතාවක ද, රයිගම්බණ්ඩාර රයිගම

පාලනය කර ඇත. මෙම බෙදීමේ දී රයිගම්පුරයට පස්යොදුන් රට ද අයිති විය. පරරාජසිංහ හෙවත් රයිගම්බණ්ඩාර දක්ෂ පාලකයකු නොවූ අතර, 1534 දී මරණයට පත්වීමත් සමග රයිගම රාජ්‍යය සීතාවකට නතුකර ගන්නා ලදී. මේ නිසා පස්යොදුන් රට සීතාවක රාජ්‍යයට ඇතුළත් විය. 1596 වන විට සමස්ත වෙරළබඩ තීරයේ බලය තහවුරු කරගත් පෘතුගීසි පාලන සමයේ දී පස්දුන් කෝරලය නිදහස් ප්‍රදේශයක් ලෙස පැවැති බව පෙනේ.

පෘතුගීසීන්ගේ දුර්දාන්ත පාලනයෙන් අසරණ භාවයට පත් පහත රට ජනයා බේරා ගැනීමේ අරමුණින් අරගලයේ නිරත වූ රණශූරයකු ලෙස වීදියබණ්ඩාර සැලැකීමට හැකි වේ. වීදියබණ්ඩාර පෘතුගීසී ජාතිකයන්ටත්, ඔවුන් අනුව ගිය ස්වදේශිකයන්ටත් විරුද්ධව අනුපමේය සංග්‍රාමයක නිරත විය. මේ වන විට බිඳ වැටෙමින් පැවැති කෝට්ටේ නීත්‍යානුකූල රාජ්‍ය විචාරකයා ලෙස වීදියබණ්ඩාර පිළිගෙන තිබූ අතර, ධර්මපාල රජුගෙන් රාජ්‍ය බලය පැහැර ගැනීමට වීදියබණ්ඩාර උත්සාහ දරන බවට පෘතුගීසීන් තුළ සැකයක් හට ගත්තේය. වහා අත්අඩංගුවට ගෙන ගෝවට පිටමං කිරීම සඳහා කොළඹ කොටුවේ සිරකර තබන ලදී. ඔහුගේ බිරිය වූ සූර්ය දේවිය දක්ෂ ලෙස උමං කරන්නන් පිරිසක් වන පල්ලරු නම් ජන කොටසේ සහය ලබා ගෙන සිරමැදිරිය තෙක් උමගක් සාදා ඉතා දක්ෂ ලෙස බළකොටුවෙන් පලායන ලදී. මෙසේ පලාගිය වීදියබණ්ඩාර ඇතුළු පිරිස රහසිගතව රයිගම් රාජධානියේ අටුලුගම නම් ස්ථානයට ගොස් එතැනින් බළ පිරිස් සහ යුද්ධායුද රැගෙන පාලින්ද නුවර බලා ගමන් කළහ. එවකට පාලින්ද නුවර අයත් වූයේ පස්දුන් කෝරලයටයි. පාලින්ද නුවර ස්වභාවික ආරක්ෂාවකින් යුත් තෝතැන්නක් විය. වීදියබණ්ඩාර සමඟ පැමිණි සේනාවන් නතර කරන ලද ස්ථාන සහ ඔහුගේ ඥාතීන් ලැගුම්ගත් ස්ථාන පිළිබඳ පුරාවෘත්ත රැසක් අදට ද ප්‍රකටව පවතී. එදා පාලින්ද නුවර සතුරු පීඩාවලින් ආරක්ෂාකර කෘෂිකර්මාන්තයෙන් ස්වයංපෝෂිත කළ නිසා වීදියබණ්ඩාර එම ප්‍රදේශයේ ජනතාවගේ නොමඳ ගෞරවයට පාත්‍රවී, දේවත්වයට ද පත් වී ඇත.

පස්දුන් රටේ ඉතිහාසය අධ්‍යයනය කිරීමේ දී කළුතර ප්‍රදේශය ගැන ද මනා අවබෝධයක් ලබාගත යුතුය. පුරාතනයේ කළුතර කාලතිත්ථ නමින් හඳුන්වා ඇත. මහාවංසයේ කළුතර පිළිබඳ තොරතුරු දැක්වෙන අවස්ථා ද හමුවේ. ක්‍රි:ව: 1017 අනුරාධපුර රාජධානිය බිඳ වැටීමෙන් අනතුරුව චෝළ පාලනය පොළොන්නරුවට සංකේන්ද්‍රණය විය. පීඩාවට පත් ජනතාව අවස්ථා කිහිපයක දී චෝළ විරෝධී සටන මෙහෙයවා ඇත. දකුණු ඉන්දියාවේ දුඑරට සිට දිවයිනට පැමිණි වික්‍රමපාණ්ඩ්‍ය කාලතිත්ථහි (ක්‍රි:ව: 1049) සිට පාලනය කර තිබේ. කාලතිත්ථය සම්බන්ධයෙන් මත දෙකක් පවතී. එක් ස්ථානයක් බටහිර වෙරළේ පිහිටි කළුතර යනුවෙන් ද, අනෙක බලන්ගොඩ ප්‍රදේශයේ පිහිටි කල්තොට යනුවෙන් ද විශ්වාස කරයි. නමුත් බොහෝ දෙනා පිළිගත් මතයක් වී ඇත්තේ වර්තමාන කළුතර ප්‍රදේශය බවයි. මුලින් සාකච්ඡා කළ පරිදි දෙවන පරාක්‍රමබාහු යුගයේ දී දේව ඇමැතිවරයා එම ප්‍රදේශයේ සංවර්ධනයට ක්‍රියාකර ඇත. රජරට ශිෂ්ටාචාරය බිඳ වැටීමෙන් අනතුරුව බටහිර වෙරළ ආශ්‍රිතව පැවැති වරායන් නාගරීකරණයට ලක්ව ඇත. ඒ අතරට කළුතර ද අයත් වේ. වාණිජ කටයුතු සඳහා පැමිණ පදිංචි වූ පිරිස් නූතනයේ ද කළුතර ප්‍රදේශය ආශ්‍රයෙන් ජීවත් වේ. තිසර සන්දේශයේ ද කළුතර පිළිබඳව තොරතුරු සඳහන් වේ.

ලන්දේසි පාලන සමයේ දී (ක්‍රි:ව: 1658 - 1796) පස්යොදුන් රට පිළිබඳ එතරම් විශේෂ සිදුවීම් දක්නට නොලැබේ. එනමුත් ඉංග්‍රීසීන් 1815 දී සමස්ත දිවයිනේම බලය ගොඩනැගෙන පස්යොදුන් රට ද පාලන පහසුව සඳහා යොදාගෙන ඇත. බෙදීම් අනුව පස්යොදුන් රට බටහිර පළාතේ, කළුතර දිස්ත්‍රික්කයට අයත් ප්‍රදේශයක් විය. නමුත් බෙන්තර ගඟේ මාර්ගය ස්වභාවික වෙනස්වීම්වලට භාජනය වූ නිසා පුරාතනයේ පස්යොදුන් රටට අයත්ව තිබූ බෙන්තර ප්‍රදේශය දකුණු පළාතට ඇතුළත් විය. ඉංග්‍රීසි පාලන සමයේ පස්යොදුන් රට මුහුදුබඩ තීරය "කළුතර කොටමුණ" ලෙස හඳුන්වා ඇත. පස්යොදුන් රටේ ඉතිරි කොටස පස්යොදුන් කෝරලය වශයෙන් හඳුන්වන ලදී.

පස්යොදුන් රට පිළිබඳව පුරාතනයේ සහ නූතනයේ ද නිරන්තර අවධානයට ලක් වූ බව පෙනේ. දිගින් සහ පළලින් යොදුන් පහකින් සමන්විත වූ නිසා පස්යොදුන් රට ලෙස ව්‍යවහාරයට පත් වන්නට විය. පාහියන් ගලින් හමුවන පුරාවිද්‍යාත්මක දත්ත මෙම ප්‍රදේශයේ ඓතිහාසිකත්වය මැනැවින් සනාථ කරයි. වගුරු බිම් වශයෙන් පැවැති ප්‍රදේශය වගා කිරීමට සුදුසු ආකාරයෙන් බිම් සකසා කෘෂිකාර්මික සංවර්ධනය ඇති කිරීම පිණිස මහා පැරකුම් රජතුමා විසින් ක්‍රියාකර ඇත. ඔහුගෙන් ආරම්භ වූ පස්යොදුන් රට පිබිදීම විවිධ අවදීන්වල නිරන්තර අවධානයට ලක් විය. කෘෂිකාර්මික හා වාණිජ කටයුතු සඳහා සුදුසු ප්‍රදේශයක් වශයෙනුත් පාලකයන්ට ආරක්ෂාව සැපයූ ක්ෂේම භූමියක් ලෙසත් පස්යොදුන් රට හැඳින්විය හැකිය.

ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය

1. සිරිවීර, ඉන්ද්‍රකීර්ති, **රජරට ශිෂ්ටාචාරය සහ නිරිතදිග රාජධානි**, කොළඹ දයාවංශ ජයකොඩි සහ සමාගම, 2001

2. ආටිගල, නිකලස්, පරණවිතාන, සෙනරත්, ලබ්රෝයි, ඩබ්ලිව්. ජේ. එෆ්. නමෙසත්, එස්. සංස්. **ලංකා විශ්වවිද්‍යාලයේ ලංකා ඉතිහාසය**, කැලණිය, විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය, 1972

3. කොඩ්රින්ටන් එච්.ඩබ්ලිව්. **සංක්ෂිප්ත ලංකා ඉතිහාසය**. ලන්ඩන්, සංශෝධිත මුද්‍රණ. 1947.

4. ඉන්ද්‍රරතන, පත්බේරිය, **පස්දුන්රට ඉතිහාසය**, කොළඹ, බස්නාහිර පළාත් සභාව, 1998.